# කසළ අවම අපේ නිවස








ත්‍යාගි ගුණවර්ධන

# කසළ අවම අපේ නිවස

කතාව නිර්මාණය සහ චිත්‍ර

තායාගි ගුණවර්ධන

මහාමායා බාලිකා විදුහල

මහනුවර

11 ශ්‍රේණිය G



ISBN 978-955-35864-0-7

# පිදුම

මාගේ ආදරණීය ගුරු මෑණිවරුන්ටත්,
පියවරුන්ටත්,
මාගේ ආදරණීය අම්මා, තාත්තා සහ
නංගීටත්
සෙනෙහසින් පුදමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01


අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා ලස්සන පරිසරය දූෂණය වෙලා මට නම් හරිම දුකයි.
කසළ ගොඩවල්වල මැස්සෝ සහ මදුරුවෝ බෝ වෙලා.
වන සත්තු කසළ කෑමට පුරුදු වෙලා.
කසළ වලින් හමන දුගද ඉවසන්න බෑ.
නිවාස අසලම කසළ ගොඩගැහිලා. ලෙඩ රෝග බෝ වෙලා.
කසළ පුච්චන ගද නිතරම දැනෙනවා.
ගංගාවේ ජලය අපවිත්‍ර වෙලා.


කැලෑ ප්‍රදේශවලට කසළ බැහැර කරන නිසා වන සත්තු ප්ලාස්ටික් ආහාරයට අරන් මිය යනවා. හරිම දුකයි.
අනේ මේ මොනාවද දැලේ තියෙන්නේ. මාළු නොවෙයිනේ.
PASTE
SODA

කසළ අවිධිමත් ලෙස බැහැර නොකර පරිසරය පවිත්‍රව තබා ගැනීම අපි හැමදෙනාගේම යුතුකමක් නේ ද?

අපි නිවසේදීම කසළ වර්ගීකරණය කර බැහැර කිරීමට පුරුදු වෙමු.






නිවසේ දී නිසියාකාරව වර්ගීකරණය කරනු ලබන කසළ නියමිත දිනට කසළ එකතු කරන ලොරියට ලබා දීමට අපි පුරුදු වෙමු.
ප්ලාස්ටික්
ටින්
වීදුරු
පොල්කටු
ප්‍රාදේශීය සභාව
ප්‍රතිචක්‍රීකරණය

**3R සංකල්පය අනුගමනය කිරීමට හුරු වීම මගින් නිවසේදීම කසළ ජනනය වීම අවම කර ගනිමු.**

- ★ ලන්ච් ෂීට් වෙනුවට කෑම පෙට්ටියක් භාවිතා කිරීම.
- ★ වෙළඳපොලෙන් බඩු මිලදී ගැනීමේ දී නැවත නැවත භාවිතා කළ හැකි මල්ලක් භාවිතා කිරීම.






ආහාර නාස්ති කරන එක හොඳ නැහැ. ආහාර ලබා ගැනීම සඳහා පොළවේ සාරය. ගොවීන්ගේ ශ්‍රමය. කාලය. මුදල් වගේම ආහාර පිළියෙල කිරීමට ශක්තියද වැය වෙනවා.



කෑමට හැකි ප්‍රමාණය පමණක් පිඟානට බෙදා ගනිමු.... කෑම ඉවත දැමීමෙන් වළකිමු ....




වැඩිපුර ඇති ආහාර අසල්වාසීන් සමඟ බෙදා ගනිමු.



# නිවසේදී සාදාගත් කොම්පෝස්ට් පොහොර යොදා ගෙවත්ත අලංකාර කර ගනිමු.



## මේ බලන්නකෝ ඉවතලන ද්‍රව්‍යවලින් වගා බඳුන් සාදා වගා කළ ලස්සන ගෙවත්තක් .....



- ★ බඳුන් වල කුඩා ඉඩමක වුවත් වගා කළ හැකියි.
- ★ විවේක අවස්ථාවල විනෝදාංශයක් ලෙස අපටත් වගා කළ හැකියි.



කසල ජනනය වීම අවම කර ගැනීමට
සහ නිවැරදිව බැහැර කිරීමට අපි සැවොම
අත්වැල් බැඳ ගනිමු.
සුන්දර ශ්‍රී ලංකාව පිවිතුරුව සුරකිමු.



# පණිවිඩය

අවිධිමත් ලෙස පරිසරයට කසළ බැහැර කිරීම නිසා වර්තමානයේ දී අප විසින් මුහුණ දෙන ගැටළු රාශියක් ඇත.

මා විසින් අඳින ලද මෙම පින්තූර පොත මඟින් කසළ ජනනය වීම නිවසේ දීම අවම කර ගැනීම සහ ක්‍රමානුකූලව නිවසින් ඉවත් කිරීම පිළිබඳව ඔබ සැම දැනුවත් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මෙම පොත සෑදීමේ දී මට සහය දැක්වූ ආදරණීය දෙමාපියන්ටත් ගුරුවරුන්ටත් මම හදවතින්ම ස්තූතිවන්ත වෙමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01